# අපේ ජන බල පක්ෂය
## எங்கள் மக்கள் சக்தி கட்சி
## Our Power Of People Party

# ව්‍යවස්ථාව

1. 2008 මැයි 01 දින පවත්වනු ලැබූ මහා සම්මේලනයේ දී සම්මත කරන ලදී.
2. 2011/01/30 දින පැවති 2 වන ජාතික මහ සමුළුවේ සම්මත වූ ව්‍යවස්ථා සංශෝධනය
3. 2013/12/22 දින පැවති 3 වන ජාතික මහ සමුළුවේ සම්මත වූ ව්‍යවස්ථා සංශෝධනය
4. 2015/03/08 දින පැවති 4 වන ජාතික මහ සමුළුවේ සම්මත වූ ව්‍යවස්ථා සංශෝධනය
5. 2019/02/24 දින පැවති විශේෂ මහා සමුළුවේ සම්මත වූ ව්‍යවස්ථා සංශෝධනය ඇතුලත්ව ඇත.

**<u>ප්‍රධාන කාර්යාලය</u>**

15/27, ආඳාගල වත්ත,

වැල්ලව පාර, කුරුණෑගල (60000)

දුරකථන අංකය: 037 22 30281

# අපේ ජන බල පක්ෂය

## පක්ෂයේ අරමුණ, ප්‍රතිපත්ති සහ ඉදිරි දැක්ම

### අරමුණ

මේ ලොවට බිහි වූ මිනිස් වර්ගයා දැහැමිව ජීවත් වී තමන් කොයි මොහොතේ හෝ මේ රට අතහැර මිය යන බව සිතේ තබාගෙන ජීවත්ව සිටිනවනම් මේ රට දියුණු කිරීම අමාරු කාර්යක් නොවනු ඇත. මිනිස් වර්ගයා විසින් සොයා ගත් නව තාක්ෂණික අසීමිත දැනුම උපයෝගී කර ගනිමින් තමන් ජීවත්ව සිටින මව්බිමට සමාජයට පිරිසිදු චේතනාවෙන් මෙහෙවරක් කර මෙලොවින් සමුගැනීම අප පක්ෂයේ අරමුණයි. තවද උගත් බුද්ධිමත් නව දේශපාලන පරපුරක් නිර්මාණය කර එම උගත් බුද්ධිමත් පුද්ගලයන්ගේ නව දැක්ම යටතේ නව අදහස් සමාජ ගත කර එම තරුණ උගත් බුද්ධිමත් පරපුර මේ රටේ තීන්දු තීරණ ගන්නා උත්තරීතර පාර්ලිමේන්තුවට එම තරුණ ප්‍රජාව යොමු කරවීම අප පක්ෂයේ අරමුණයි.

විද්‍යාව හා තාක්ෂණයේ අසීමිත ජයග්‍රහණයන් තුලින් සොයා ගත් නව දැනුම තුලින් අප ජීවත්ව සිටින මේ කෙටි කාලය තුල මිනිසා සතුටින් තම දරුවන් සමඟ කාලය ගත කරවීම අප පක්ෂයේ අරමුණයි.

සිතීමේ ශක්තිය තුලින් ලෝකය හඳුනාගෙන තමාට සුවදායි ස්ථානයක් වශයෙන් ජනතාව ජීවත් කරවීම අප පක්ෂයේ අරමුණයි.

ජනතාව මෙන්ම ශ්‍රී ලංකාව තුල ජීවත් වන අනෙකුත් සියලු සත්වයන් සම්බන්ධයෙන් ඔවුන්ගේ නිදහසේ ජීවත් වීමේ අයිතිය ලබා දීම අප පක්ෂයේ අරමුණයි.

විවිධ ජාතීන් විසින් එකිනෙකාට වෙනස් රාජ්‍යයන් තුල වෙනස් අරමුණ සමාජගත කිරීම තුළින් සමාජය ඇති වී තිබෙන විකෘති භාවයෙන් ගලවා මහ ජනයා දැහැමිව සමාජගත කරවීම අප පක්ෂයේ අරමුණයි.

විද්‍යාවේ සහ තක්ෂණයේ සිය පෙරලිකාර සංවර්ධනය තුළින් මිනිසා දිනෙන් දින වේගයෙන් ඉදිරියට යොමු කර ඊට සමාන්තරව දේශපාලන දර්ශණයක් සමාජගත කර බෞද්ධ දර්ශනය තුලින් මහා සංඝරත්නයේ ආශිර්වාදය ඇතිව ජනතා අවශ්‍යතා ඉටුකරලීම, මිනිසාට සතුටින් ජීවත් වීමට මේ රට නිර්මාණය කර දීම, අපේ ජන බල පක්ෂයේ ප්‍රධාන දේශපාලන අරමුණයි.

## පක්ෂයේ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා වාසී මහජනයා මුහුණ දී ඇති අතිශය අභියෝග හඳුනාගෙන එම අභියෝග ජය ගැනීම සඳහා සුදුසු ප්‍රතිපත්ති මාලාවක් ඉදිරිපත් කරන්නෙමු. සියවස් ගණනාවක් අප කොළ, නිල්, රතු වර්ණ බේදයේ ගොදුරු බවට පත් වී සිටින අතර දැන් අපට ඉන් මිදීමට කාලය එළඹ ඇත. ශ්‍රී ලාංකික ජනතාව වෙනුවෙන් අපේ ජන බල පක්ෂයේ ප්‍රතිපත්තිය මේ රට දේශීයත්වයට ප්‍රදාන තැනක් දෙමින් රට එයින් මුදවා ගැනීම අපේ ප්‍රතිපත්තියයි.

සුදු අධිරාජ්‍යයවාදීන් විසින් නිදහස ලබා දුන් නමුත් එය නමට පමණක් සීමා කරන්න ඔවුන් සිය බලය ව්‍යාප්ත කර ඇති බව දැන් අපට වැටහෙනු ඇත. මොවුන් විසින් සමස්ථ ලාංකීය ජනතාවම දැවැන්ත අර්බුදයකට ප්‍රපාතයකට තල්ලු කරමින් සිටී. රට පාලනය කරන රාජ්‍ය තන්ත්‍රයම මුළු මනින්ම වෙනස් කොට නැවත නිර්මාණය කල යුතු බව සහ අළුත් අත්තිවාරමක් මත නව රාජ්‍ය තන්ත්‍රය ස්ථාපිත කල යුතු බව අපේ ප්‍රතිපත්තිය වී තිබේ.

## ඉදිරි දැක්ම

රාජ්‍ය තන්ත්‍රයේ සොබාව විස්තර කරන්නා වූ නෛතික ලේඛනය වන ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව අලුතින් සකස් වීම තුලින් ප්‍රධාන අරමුණු රාශියක් ජය ගැනීමට අපට හැකිවනු ඇත. එමගින් ජාතීන් අතර පවතින්නා වූ ආගමික හා භාෂාමය, ජාතීන් සතු ගෞරවය, අභිමානය, අයිතිය සැකසුනු නව රාජ්‍යය ව්‍යවස්ථාවක් අප ස්ථාපිත කල යුතුය. ශ්‍රී ලංකාවේ රාජ්‍යය කැබලි නොවීමේ කොන්දේසිය මත එක්සත් රාජ්‍යයක් තුල සියලු ජාතීන්ට ජීවත් වීමේ අයිතිය ලබා දී ලෝක දේශපාලන ඉතිහාසයෙන් ගත හැකි උපරිම ප්‍රයෝජන ගෙන අප මව්බිමට ගැලපෙන පරිද්දෙන් එය සකස් විය යුතුයි. එසේ බිහිවන නව ශ්‍රී ලංකා රජය ශක්තිමත් බලවත් එක්සත් බෞද්ධ දර්ශනයට මුල් තැනක් දෙන දේශියත්වය අගයන බෞද්ධ රාජ්‍යයක් සහ රට පුරා එකම නීතියක් විය යුතුයි. අධිකරණය, රාජ්‍ය සේවය, ජනමාධ්‍යය සහ මැතිවරණ ක්‍රියාවලිය මුළුමනින්ම රාජ්‍ය පාලකයන්ගෙන් ස්වාධීනව පැවැත්විය යුතුයි. එය නව ව්‍යවස්ථාව තුලින් සහතික කල යුතුයි.

රජය ආර්ථික සංවර්ධනයේ මග පෙන්වන්නා සහ බාධක ඉවත් කරන්නා වන අතර එහි අයිතිකරුවා නොවිය යුතුයි. රජය පුද්ගලික අංශය සමග සාධාරණ අතිශය සමාන කොන්දේසි යටතේ තරඟ කරුවෙක් වෙමින් ජනතාවට වඩා උචිත ජීවිතයක් අත්පත් කර දීම සඳහා කටයුතු කල යුතුයි.

නාස්තිය දූෂණය අල්ලස මෙරටින් තුරන් කිරීමට උපරිම බලතල සහිත කමිටුවක් ඊට අදාල යාන්ත්‍රනයක් දීප ව්‍යාප්ත කල යුතුයි.

අප මව්බිම සංවර්ධනයේ උපරිම ස්ථානයකට ගෙන යාමට කෘෂි කර්මාන්තය කාර්යක්ෂම කර ආහාර වස විසින් තොර ජනතාවගේ සෞඛ්‍ය පෝෂණය ගැන ඉතා වගකීමකින් ස්වයංපෝෂිත දේශයක් ගොඩ නැගීමේ ඉලක්කය ජය ගැනීමට සියලු බාධා ඉවත් කල යුතුයි.

විරැකියාව දූගී දුප්පත්කම මුලු මනින්ම තුරන් කිරීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික සැලසුම් සකස් කර ක්‍රියාවට නැගිය යුතුයි.

දූෂණය, නාස්තිය, සොරකම මුළුමනින් වෙනස් කලහැකි වන්නේ දැනට පවතින රාජ්‍ය තන්ත්‍රය වෙනුවට ඉහත පැහැදිලි කර ඇති ආකාරයට නව රාජ්‍ය තන්ත්‍රයක් ස්ථාපිත කිරීමෙන් පමණි.

අපගේ විදේශ ප්‍රතිපත්ති නිර්මාණය වන්නේ ඉහත අරමුණ ජය ගැනීමෙන් සහ ජනතාවගේ බලාපොරොත්තු සපල වීමෙන් පසු බව අපගේ විශ්වාසයයි.

අප රජයක් යටතේ මව්බිමේ ජනතාවට ලෝකයේ සෙසු ජනතාව ඉදිරියේ ගෞරවයෙන්, අභිමානයෙන් පෙනී සිටිය හැකි වාතාවරණයක් සකස් කිරීම සහ ජාත්‍යන්තරයේ විශ්වාසය දිනා ගත් දේශයක් වශයෙන් අපගේ ශ්‍රී ලංකාව ගොඩනගා ගැනීමට විදේශ ප්‍රතිපත්තියක් අප විසින් ගොඩ නගනු ඇත.

# අපේ ජන බල පක්ෂයේ ව්‍යවස්ථාව

## පළමු පරිච්ජේදය

1) පක්ෂයේ නම

(ඒ) අපේ ජන බල පක්‍ෂය

(බී) **எங்கள் மக்கள் சக்தி கட்சி**

(සී) **Our Power of People Party**

I. පක්ෂයේ මැතිවරණ සලකුණ "ධජය" වන්නේය.

II. පක්ෂයේ නිළ වර්ණය ලා දම් පැහැය වන්නේය.

III. පක්ෂයේ ප්‍රධාන කාර්යාලය - 15/27, ආඳාගල වත්ත,
වැල්ලව පාර, කුරුණෑගල.

2) පක්ෂයේ සාමාජිකත්වය

I. වයස අවුරුදු 17 සම්පූර්ණ වී ඇති පිරිමි/ කාන්තා දෙපක්ෂයේ ඕනෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුට පක්ෂයේ සාමාජිකත්වය ඉල්ලුම් කල හැක.

II. පක්‍ෂයට බැඳෙන සෑම කෙනෙක්ම පහත සඳහන් දිවුරුම් අත්සන් කළ යුතුය. "මම පක්‍ෂයේ පොදු වැඩ පිළිවෙලට එකඟ වෙමි. ඒ අරමුණු සහ ඉලක්ක සඳුරා ගැනීමට ක්‍රියා කරමි. පක්‍ෂයට භක්තිමත් වෙමි. එහි තීරණයන් හා විධි විධානයන් ක්‍රියාවට නගමි."

III. වෙනත් කිසිම දේශපාලන පක්ෂයක සාමාජිකයකු හෝ සාමාජිකාවකට අපේ ජන බල පක්ෂයේ සාමාජිකත්වය ලබා ගත නොහැක.

IV. පක්ෂ සාමාජිකත්වය සඳහා ඉල්ලීමක් කල දින සිට මාස 03ක කාලයක් ගතවන තෙක් ඔහු හෝ ඇය අර්ධ සාමාජිකයෙකු වශයෙන් සැලකේ.

V. අර්ධ සාමාජිකයෙකු විසින් සිය සාමාජික අයදුම් පත්‍රය තමා ස්ථිර පදිංචිය දරණ ප්‍රදේශයේ පක්ෂ ශාඛා සමිතියේ පූර්ණ සාමාජිකයන් දෙදෙනෙකුගේ යෝජනා ස්ථිරත්වයෙන් වාර්ෂික සාමාජික ගාස්තුවද සමගින් එම ශාඛා සමිතියේ ලේකම්වරයාට භාරදිය යුතුය.

ශාඛා සමිතියේ ලේකම්වරයා විසින් එම අයදුම්පත්‍රය දිස්ත්‍රික් සංවිධානයේ ලේකම්වරයා මගින් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයාට යොමු කළ යුතුය.

ඉන්පසු ගතවන මාස 03ක අධීක්ෂණ කාල සීමාව තුලදී මෙම සාමාජිකත්ව අපේක්ෂකයා සම්බන්ධයෙන් කිසියම් විරෝධතාවක් පැණ නොනැගුනහොත් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා විසින් ඔහු හෝ ඇය වෙතට පූර්ණ සාමාජිකත්වය පිරි නමනු ඇත. එතැන් සිට ඔහු පක්ෂයේ පූර්ණ සාමාජිකයෙකු වශයෙන් පිළිගැනේ.

VI. සාමාජිකත්ව අපේක්ෂකයා ස්ථිර පදිංචිය දරණ ප්‍රදේශයේ පක්ෂ ශාඛා සමිතියක් නොමැති විටකදී පක්ෂයේ ස්ථිර සාමාජිකයන් දෙදෙනෙකුගේ අනුමැතිය සහිතව සාමාජික අයදුම් පත්‍රය පක්ෂයේ දිස්ත්‍රික් සංවිධානයේ ලේකම්වරයා මගින් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා වෙත යොමු කල යුතුය. මෙහිදී පක්ෂයේ දිස්ත්‍රික් සංවිධානය යනු, සාමාජිකත්ව අපේක්ෂකයා ස්ථිර පදිංචිය දරණ මැතිවරණ දිස්ත්‍රිකයේ පක්ෂයේ දිස්ත්‍රික් සංවිධානයයි.

VII. මීට අමතරව යම් සාමාජිකත්ව අපේක්ෂකයෙකු හට සාමාජිකත්වය පිරි නැමීම සඳහා පක්ෂයේ පහත දැක්වෙන සංවිධාන සහ පුද්ගලයන් හට බලය ඇත.

(ඒ) පක්ෂයේ නායකත්වයට (සභාපති) ලේකම් ඇතුළු අට (8) දෙනෙකු පත් කිරීමේ බලය ඇත.

(බී) පක්ෂයේ පක්‍ෂ නායක සමග දේශපාලන මණ්ඩලයට.

VIII. යම් සාමාජික අපේක්ෂකයෙකු හට සිය සාමාජිකත්වය ලබා ගැනීමට නොහැකි වුවහොත් ඒ සඳහා පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා වෙත නැවත ඉල්ලීමක් කෙරිය හැක.

3) සාමාජික මුදල්

I. සෑම සාමාජිකයෙකුම රු.100/-ක වාර්ෂික මුදලක් ගෙවිය යුතුය.

II. පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සියළුම සාමාජිකයන් පක්ෂ සාමාජික ගාස්තුවට අමතර රු.1000ක මුදලක් වාර්ෂිකව ගෙවිය යුතුය.

III. පක්ෂයේ දේශපාලන මණ්ඩල සාමාජිකයන් පක්ෂ සාමාජික ගාස්තුවට අමතරව රු. 5000/-ක මුදලක් වාර්ෂිකව ගෙවිය යුතුය.

IV. පළාත් පාලන අයතනවලට මහජන ඡන්දයෙන් තේරී පත්වන පක්ෂයේ නියෝජිතයන් (මන්ත්‍රීවරුන්) සිය වාර්ෂික වැටුපෙන් 5%ක් පක්ෂයේ අරමුදලට දයක කල යුතු වේ.

V. පළාත් පාලන ආයතනයක සභාපති, උප සභාපති, උප නගරාධිපති සහ නගරාධිපති තනතුරු සඳහා තේරී පත්වන පක්ෂයේ නියෝජිතයින් සිය වාර්ෂික වැටුපෙන් 10%ක් පක්ෂයේ අරමුදලට දයක කල යුතු වේ.

VI. පළාත් සභාවක මන්ත්‍රීවරයෙකු හෝ අමාත්‍යවරයෙකු වශයෙන් තේරී පත්වන පක්ෂයේ නියෝජිතයෙකු සිය වාර්ෂික වැටුපෙන් 10%ක් පක්ෂයේ අරමුදලට ලබා දිය යුතුය.

VII. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්වන පක්ෂයේ නියෝජිතයෙකු සිය වාර්ෂික වැටුපෙන් 10%ක් පක්ෂයේ අරමුදලට ලබා දිය යුතු වේ.

VIII. පාර්ලිමේන්තුවේ ඇමතිවරයෙකු, නියෝජ්‍ය අමාත්‍යවරයෙකු, කථානායකවරයා හෝ නියෝජ්‍ය කථානායකධූරයට පත්වන පක්ෂයේ නියෝජිතයෙකු සිය වාර්ෂික වැටුපෙන් 10%ක් පක්ෂයේ අරමුදලට වාර්ෂිකව දයක කල යුතු වේ.

IX. මීට අමතරව පක්ෂයේ සාමාජිකයන්, පක්ෂයේ නිළධාරීන් හා පක්ෂයේ මහජන නියෝජිතයින් පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් නියම කරනු ලබන අනුග්‍රහයන් පක්ෂය වෙත ලබා දීමට බැඳී සිටිය යුතුය.

4) **සාමාජිකත්වය අළුත් කිරීම**

සෑම වර්ෂයකම මුල් තුන් (03) මාසය තුලදී එම වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවීමෙන් තම සාමාජිකත්වය දීර්ඝ කර ගත යුතුය.

5) **පක්ෂයේ සාමාජිකයන්ට අදල කොන්දේසි**

I. පක්ෂයේ ප්‍රතිපත්ති, දේශපාලන වැඩ පිළිවෙල සහ පක්ෂයේ විනයට මුළුමනින්ම එකඟව ක්‍රියාකල යුතුය.

II. පක්ෂයේ ව්‍යවස්ථාවට අනුව ක්‍රියා කල යුතුය.

III. සියළුම මැතිවරණ වලදී පක්ෂය විසින් නම් කරනු ලබන නියෝජිතයින්ට හෝ නියෝජිතයෙකුට උපරිම සහයෝගයෙන් ක්‍රියා කළ යුතුයි.

IV. පක්ෂයේ කීර්තියට හානිකර නොවන අයුරින් සිය පෞද්ගලික ජීවන පැවැත්ම ගෙන යාම සහ ආදර්ශමත්, ගෞරවනීය, ශ්‍රී ලාංකික පුරවැසියෙකු ලෙසින් සමාජය තුල ක්‍රියාත්මක විය යුතුයි.

6) පක්ෂ සාමාජිකයෙකු සතු අයිතිවාසිකම්

I. පක්ෂයේ පූර්ණ සාමාජිකත්වය ලැබූ අයෙකුට පක්ෂ සාමාජිකත්වයේ සිට පක්ෂ නායකත්වය දක්වා වූ පක්ෂය තුල ඕනෑම නිළයකට පත්වීමට පූර්ණ අයිතිය ඇත්තේය.

II. පක්ෂය තරඟ කරන ඕනෑම මැතිවරණයකදී පක්ෂයේ අපේක්ෂකයෙකු වශයෙන් තරඟ කිරීම සඳහා ඉල්ලුම් කිරීමට සෑම පක්ෂ සාමාජිකයෙකුටම අයිතිය ඇත්තේය.

III. සමාජයේ ඕනෑම ස්ථානයකදී, ඕනෑම ක්‍රියාකාරීත්වයකදී පක්ෂය විසින් නම් කරන ලද විගස පක්යේ නියෝජිතයා වශයෙන් ක්‍රියාකිරීමට සෑම සාමාජිකයෙකුටම අයිතිය ඇත්තේය.

IV. පක්ෂයේ ඉහළ මණ්ඩලයන් විසින් (දේශපාලන මණ්ඩලය, මධ්‍යම කාරක සභාව, දිස්ත්‍රික් සංවිධානය) ගනු ලබන්නා වූ යම් තීරණ හෝ ක්‍රියාමාර්ගයක් සම්බන්ධයෙන් සිය මතය පක්ෂ නායකත්වය වෙත ලිඛිතව යොමු කිරීමට සෑම සාමාජිකයෙකුටම අයිතිය ඇත්තේය.

V. පක්ෂයේ ඕනෑම තරාතිරමක නිළධාරියෙකු, නිළධාරිනියක එසේත් නැත්නම් නායකයකු හෝ නායිකාවකගේ ක්‍රියා කලාපය පක්ෂයේ කීර්තියට, සංවර්ධනය සහ පොදු සමගියට බාධාවක් යැයි හැඟේ නම් ඒ සම්බන්ධයෙන් නායකත්වයට සහ පක්ෂයේ දේශපාලන මණ්ඩලයට ලිඛිතව කරුණු දැක්වීමට සෑම සාමාජිකයෙකුටම අයිතිය ඇත්තේය.

VI. පක්ෂයේ උන්නතිය සඳහා වේ යැයි තමා හිතන යෝජනාවක් ඇත්නම් එම යෝජනාව තමා නියෝජනය කරන ශාඛා සමිතියට ඉදිරිපත් කර සම්මත කර ගැනීමෙන් පසුව පක්ෂයේ ඉහළ මණ්ඩල වෙත යොමු කරවීමට සෑම සාමාජිකයෙකුටම අයිතිය ඇත්තේය.

VII. එමෙන්ම, සෑම විටකදීම බහුතරයේ මතය පිළිගැනීමට සෑම සාමාජිකයෙක්ම බැඳී ඇත්තේය.

(9)

## දෙවන පරිච්ඡේදය

❖ අපේ ජන බල පක්ෂයේ ව්‍යුහය පහත දැක්වෙන පරිදි සකස් විය යුත්තේය.

1

i. ශාඛා සමිති
ii. මැතිවරණ කොට්ඨාශ සංවිධාන
iii. මැතිවරණ දිස්ත්‍රික් සංවිධාන
iv. මධ්‍යම කාරක සභාව
v. දේශපාලන මණ්ඩලය
vi. විනය මණ්ඩලය
vii. ප්‍රජාව තරුණ සංවිධානය
viii. ප්‍රජාව කාන්තා සංවිධානය
ix. ප්‍රජාව මහ සම්මේලනය
x. මැතිවරණ කොට්ඨාශ සංවිධායක
xi. දිස්ත්‍රික් සංවිධායක

❖ 2 වන පරිච්ඡේදයේ 1 වන වගන්තිය යටතේ සඳහන් සංවිධානයන්ගේ ක්‍රියාකාරිත්වය පහත දැක්වෙන අයුරින් විය යුත්තේය.

2

i. ශාඛා සමිතිය

a. යම් මැතිවරණ කොට්ඨාශයක (මැතිවරණ බල ප්‍රදේශයක) පිහිටි සෑම ග්‍රාම සේවා වසමක් තුලම අවම වශයෙන් පක්ෂයේ එක් ශාඛා සමිතියක් බැගින් පිහිටුවිය යුතුය.

b. ශාඛා සමිතියක් පිහිටුවීමට අවම වශයෙන් 15 දෙනෙකු සිටිය යුතුය. ඔවුන් සෑම අයෙකුම වයස අවුරුදු 18 සම්පූර්ණ විය යුතුය.

c. මෙම සෑම ශාඛා සමිතියක්ම සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික සහ කාරකසභිකයින් 05 දෙනෙකු ඇතුලත් නිළධාරී මණ්ඩලයක් තෝරා පත්කර ගත යුතුය.

d. එම සෑම ශාඛා සමිතියක්ම පිහිටුවීමේදී අවම වශයෙන් පක්ෂයේ දේශපාලන මණ්ඩල සාමාජිකයෙකුම හෝ මධ්‍යම කාරක සභිකයෙකු එම රැස්වීම් වාරයට සහභාගී විය යුතුය.

e. එසේ පිහිටුවා ගන්නා සෑම ශාඛා සමිතියක්ම සමිතියේ පූර්ණ වාර්තාවක්, නිළධාරී මණ්ඩල ලේඛණයක් සහ සාමාජික නම් සහ අත්සන් ලේඛණ දෙකක් සමගින් දිස්ත්‍රික් සංවිධානයේ ලේකම්වරයා හරහා පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයාට යොමු කල යුතුය.

ඉන්පසු, පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා විසින් එම ශාඛා සමිතිය පක්ෂයේ පිළිගත් ශාඛා සමිතියක් වශයෙන් දේශපැලන මණ්ඩලයේ අනුමැතිය සහිතව පක්ෂ මූලස්ථානයේ ලියාපදිංචි කරවීමට ක්‍රියා කල යුත්තේය.

ii. තරුණ සමිතිය

a. සෑම ග්‍රාමසේවා කොට්ඨාශයකම අවම වශයෙන් එක් තරුණ සමිතියක්වත් පිහිටවිය යුතු අතර, ඒ සඳහා සාමාජිකයන් 15 දෙනෙකුවත් අවම සිටිය යුතුය.

b. මෙම තරුණ සමිතියක සාමාජික/ සාමාජිකාවන් වයස අවුරුදු 16ත් 35ත් අතර විය යුතුයි.

c. සෑම තරුණ සමිතියකම සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික සහ කාරකසභිකයින් 05 දෙනෙකුගෙන් සමන්විත නිළධාරී මණ්ඩලයක් තෝරා පත් කර ගත යුතුය.

d. මෙලෙස පිහිටුවාගන්නා සෑම තරුණ සමිතියක්ම සමිතියේ පූර්ණ වාර්තාවක්, නිළධාරී මණ්ඩලය සහ සාමාජික නම් සහ අත්සන් ලේඛණ වාර්තා දෙක බැගින් පක්ෂයේ තරුණ සංවිධානයේ ලේකම්වරයා මගින් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයාට යොමු කල යුතුය.

e. ඉන්පසු, පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා විසින් එම තරුණ සමිතිය පක්ෂයේ පිළිගත් තරුණ සමිතියක් වශයෙන් පක්ෂ මූලස්ථානයේ ලියාපදිංචි කල යුතු අතර, ඒ සඳහා දේශපාලන, මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා ක්‍රියාකල යුත්තේය.

iii. වෙනත් ආයතනවල ශාඛා සමිති පිහිටුවීම.

රජයේ හෝ පෞද්ගලික ආයතන තුල මෙන්ම අධ්‍යාපන ආයතන තුලද පක්ෂයේ ශාඛා සමිති, තරුණ සමිති සහ කාන්තා සමිති පිහිටුවිය හැක. නමුත් ඒ සඳහා පළමුව, පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුය.

අනුමැතිය ලද හොත් වෙනත් ඕනෑම ශාඛා/තරුණ/කාන්තා සමිතියක් පිහිටුවීම සහ ලියාපදිංචි කිරීම සඳහා වූ ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමෙන් එම සමිතියද පක්ෂයේ ලියාපදිංචි සමිතියක් බවට පත් කල හැක.

iv. ශාඛා සමිති කිහිපයක සාමාජික්වය දැරීම සම්බන්ධව

a. කිසිදු පක්ෂ සාමාජිකයෙකුට හෝ සාමාජිකාවකට එකවර එකම වර්ගයේ ශාඛා සමිති දෙකක සාමාජිකත්වය දැරිය නොහැක.

b. නමුත්, යම් පක්ෂ සාමාජිකයෙකුට හෝ සාමාජිකාවකට එකම ග්‍රාම සේවා වසමක් තුල එකිනෙකට වෙනස් වර්ග දෙකකට අයත් (ශාඛා/ තරුණ/ කාන්තා යන වර්ග තුන අතුරින්) සමිති දෙකක සාමාජිකත්වය දැරිය හැක.

c. නමුත්, කිසිදු සාමාජිකයෙකු හෝ සාමාජිකාවක විසින් එක් ශාඛා සමිතියක යම් නිලයක් දරයිනම් අනිත් සමිතියේ කිසිදු නිලයකට පත් නොවිය යුත්තේය.

3. **මැතිවරණ කොට්ඨාශ සංවිධානය සහ නිළධාරී මණ්ඩලය**

(මෙහි මැතිවරණ කොට්ඨාශයක් යනුවෙන් හඳුන්වා ඇත්තේ 1978 ට පෙර පැවති මැතිවරණ කොට්ඨාශයකට අයත් ප්‍රදේශයයි.)

I. මැතිවරණ කොට්ඨාශයක් තුළ පිහිටුවා ඇති සෑම ශාඛා/තරුණ/කාන්තා සමිතියකම සභාපති, ලේකම් යන තනතුරු දරන්නන් සිය නිළ බලයෙන් මෙම සංවිධානයේ සාමාජිකත්වය දරනු ඇත.

II. අදල මැතිවරණ කොට්ඨාශය තුළ ඇති පළාත් පාලන ආයතනයන්හි මහජන නියෝජිතයන් වශයෙන් තේරී පත්ව සිටින පක්ෂයේ සාමාජිකයන් සහ මැතිවරණ කොට්ඨාශය තුල ස්ථිර පදිංචිය දරණ පළාත් සභා සඳහා තේරී පත්ව සිටින පක්ෂයේ සාමාජිකයන් සිය නිළ බලයෙන් මැතිවරණ කොට්ඨාශ සංවිධානයේ සාමාජිකත්වය දරනු ඇත.

III. එම මැතිවරණ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචිය දරන්නා වූ ද පාර්ලිමේන්තුව නියෝජනය කරන්නා වූ පක්ෂයේ සාමාජික පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු සිටියි නම් ඔහු සිය නිළ බලයෙන් එම සංවිධානය නියෝජනය කරන අතර, ඔහු එම සංවිධානයේ සභාපති පදවිය දැරිය යුත්තේය. ඔහු එම මැතිවරණ කොට්ඨාශයේ සංවිධායකවරයාද වන්නේය.

IV. එම මැතිවරණ කොට්ඨාශය තුල පාර්ලිමේන්තුව නියෝජනය කරන්නා වූ පක්ෂයේ සාමාජිකයෙකු නොමැති අවස්ථාවලදී පක්ෂයේ නායකයා විසින් එම මැතිවරණ කොට්ඨාශ සඳහා සංවිධායකවරයෙකු පත්කල යුතු අතර, එවැනි අවස්ථාවකදී ඔහු නිල බලයෙන් එම මැතිවරණ කොට්ඨාශ සංවිධානයේ සභාපතිවරයා වන්නේය.

V. මීට අමතරව, පක්ෂයේ දේශපාලන මණ්ඩලය තීරණය කරනු ලබන අවස්ථාවකදී 10 දෙනෙකුට නොවැඩි සාමාජිකයන් ප්‍රමාණයක් මැතිවරණ කොට්ඨාශ සංවිධානයේ නියෝජිතයන් වශයෙන් පත් කරනු ලැබිය හැකිය. එසේ පත් කරනු ලබන්නන් එම මැතිවරණ කොට්ඨාශය තුල ස්ථිර පදිංචිකරුවන් විය යුතු අතර, නිළධාරී මණ්ඩලයට පත්වීමට අවස්ථාවක් ඔවුන් හට නොමැත.

VI. මැතිවරණ කොට්ඨාශ සංවිධානය පහත දැක්වෙන නිළධාරී මණ්ඩලයෙන් සමන්විත විය යුත්තේය.

VII. සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උප සභාපති, උප ලේකම් සහ කාරක සභිකයන් දහ(10) දෙනෙකු එම නිළධාරී මණ්ඩලයට ඇතුලත් විය යුතුය.

VIII. මෙම නිළධාරී මණ්ඩලය එම මැතිවරණ කොට්ඨාශය තුල පක්ෂයේ ක්‍රියාකාරී මණ්ඩලය වන්නේ ය.

4. මැතිවරණ කොට්ඨාශ සංවිධානයේ කාර්යභාර්ය

I. මෙම සංවිධානය අදල මැතිවරණ කොට්ඨාශය තුල පක්ෂයේ සියළු කාර්යයන් සපුරාලිය යුතුය. පක්ෂයේ දේශපාලන මණ්ඩලය විසින් පවරනු ලබන්නා වූ පක්ෂයේ ඕනෑම දේශපාලන අවශ්‍යතායක් ඉටු කිරීමට මෙම සංවිධානය බැඳී ඇත්තේය.

II. පක්ෂය ඕනෑම මැතිවරණයකට මුහුණ දෙන අවස්ථාවකදී පක්ෂයේ මැතිවරණ ක්‍රියාවලිය සඳහා මැතිවරණයට පෙර මාස 02ක කාලය තුලදී පූර්ණ කාලීන ක්‍රියාකාරීකයන් අවම වශයෙන් 15 දෙදෙනෙකුගේවත් සේවය පක්ෂය වෙතට ලබා දීමට සෑම මැතිවරණ කොට්ඨාශ සංවිධානයක්ම ක්‍රියාකල යුතුය.

III. මෙම සංවිධානයේ යෝජනා සම්මතයකින් පසුව පක්ෂයේ කාර්යයන් සඳහා අරමුදලක් ගොඩනැගීමටත් එම අරමුදල් තැන්පත් කිරීම උදෙසා බැංකු ගිණුම් පවත්වාගෙන යාමටත් මෙම සංවිධානයට බලය තිබේ. නමුත්, ඒ සඳහා පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ අනුමැතිය පළමුව ලබා ගත යුතුය.

එසේ එකතු කරනු ලබන්නා වූ අරමුදල් වැය කිරීමේදී සංවිධානයේ ක්‍රියාකාරී මණ්ඩලයේ අනුමැතිය ඇතුව එය කල යුතු අතර, සෑම වර්ෂයකටම වරක් අය වැය සභා සම්මත කිරීමෙන් පසුව පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා වෙතට පිටපතක් යොමු කල යුතුය.

IV. මෙම කොට්ඨාශ සංවිධානයක් මගින් එකතු කරනු ලබන අරමුදල් පක්ෂයේ පොදු ක්‍රියාවන් උදෙසා පක්ෂ මූලස්ථානයට ලබා ගැනිමට අවශ්‍ය වූ විටෙක එසේ ලබා ගැනීමට පක්‍ෂයේ සභාපතිවරයාට බලය ඇත.

පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා විසින් දේශපාලන මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් එහි අනුමැතිය ලැබීමෙන් පසුව පක්ෂයේ සභාපතිවරයාට ඕනෑම කොට්ඨාශ සංවිධානයක බැංකු ගිණුම් හි ඇති මුදලක් පක්ෂ මූලස්ථානය වෙත ලබා ගැනීමට බලය ඇත.

V. මෙම මැතිවරණ කොට්ඨාශ සංවිධානය අවම වශයෙන් මාස 04කට වරක්වත් රැස්විය යුතු අතර, එම සංවිධානයේ ක්‍රියාකාරී මණ්ඩලය මාස 03කට වරක්වත් රැස්විය යුත්තේය. එම සෑම රැස්වීමකම වාර්ථාවක පිටපතක් සංවිධානයේ ලේකම්වරයා විසින් පක්ෂ මූලස්ථානයට එවිය යුතුය.

VI. අදල මැතිවරණ කොට්ඨාශය තුල සෑම ශාඛා/තරුණ/කාන්තා සමිති වලට අයත් සියළුම පක්ෂ සාමාජිකයන් සම්බන්ධයෙන් සොයා බැලීමටත් ඔවුන්ගේ පක්ෂ විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් ලැබෙන ලිඛිත පැමිණිලි සම්බන්ධයෙන් යම් පියවරක් ගැනීමට අවශ්‍ය වන්නේ නම් එම ලිඛිත තොරතුරු පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයාට සහ පක්ෂයේ උත්තරීතර විනිශ්චය සභාවටත් යොමු කිරීමට ක්‍රියාකාරී මණ්ඩලයේ සභාපතිවරයා වග බලා ගත යුතුය.

VII. මෙම සංවිධානයේ ක්‍රියාකාරී මණ්ඩලයේ සාමාජිකයෙකුට එරෙහිව යම් පක්ෂ විනය විරෝධී ක්‍රිය පටිපාටියක් සම්බන්ධයෙන් හෝ වෙනයම් පක්ෂයේ උන්නතියට බාධාවන ක්‍රියාකාරීත්වයක් සම්බන්ධයෙන් හෝ වෙනයම් පැමිණිල්ලක් ඇත්නම් එය දිස්ත්‍රික් සංවිධානයේ ලේකම්වරයා මගින් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයාට සහ පක්ෂයේ උත්තරීතර විනිශ්චය සභාවට යොමු කිරීමට ඕනෑම සාමාජිකයෙකුට අයිතිය ඇත.

VIII. මෙම සංවිධානය වෙනුවෙන් නිකුත් කරන සියළු ලිපි සංවිධානයේ සභාපතිවරයාගේ (මැතිවරණ කොට්ඨාශයේ සංවිධායකවරයාගේ) අනුමැතිය සහිතව සංවිධානයේ ලේකම්වරයා විසින් නිකුත් කල යුත්තේය.

5. **මැතිවරණ දිස්ත්‍රික් සංවිධානය සහ නිළධාරී මණ්ඩලය**

I. මෙහි මැතිවරණ දිස්ත්‍රික්කය යනුවෙන් හඳුන්වනු ලබන්නේ 1978න් පසුව අනුපාතික මැතිවරණ ක්‍රමය යටතේ හඳුන්වා දෙනු ලැබී ඇති මැතිවරණ බල ප්‍රදේශයයි.

II. මැතිවරණ දිස්ත්‍රික්කයක් තුල පිහිටා ඇති මැතිවරණ කොට්ඨාශ සංවිධානයන්හි ක්‍රියාකාරී මණ්ඩලයේ සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන නිළධාරීන් තිදෙනා සිය නිළ බලයෙන් මැතිවරණ දිස්ත්‍රික් සංවිධානයේ සාමාජිකයන් වශයෙන් පත් වේ.

III. එම මැතිවරණ දිස්ත්‍රික්කය තුල පිහිටි ප්‍රාදේශීය සභාපතිවරයෙකු, නගර සභාවක නගරාධිපතිවරයෙකු සහ උප නගරාධිපතිවරයෙකු, පළාත් සභාවක මන්ත්‍රීවරයෙකු හෝ මන්ත්‍රීවරියක පක්ෂයේ සාමාජිකයෙකු වන අවස්ථාවකදී ඔහු හෝ ඇය නිල බලයෙන් දිස්ත්‍රික් සංවිධානයේ සාමාජිකයෙකු වන්නේය.

IV. පක්ෂයේ සභාපතිවරයා විසින් මැතිවරණ දිස්ත්‍රික්කයන් සඳහා දිස්ත්‍රික් සංවිධායකවරයෙකු පත් කරනු ලැබිය යුතු අතර, ඔහු නිළ බලයෙන් මැතිවරණ දිස්ත්‍රික් සංවිධානයේ සභාපතිවරයාද වන්නේය. එසේ පත් කරනු ලබන දිස්ත්‍රික් සංවිධායකවරයා එම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුත්තේය.

V. මීට අමතරව, පක්ෂයේ සභාපතිවරයාගේ අනුමැතිය සහිතව පක්ෂයේ දේශපාලන මණ්ඩලයට මැතිවරණ දිස්ත්‍රික් සංවිධානයකට උපරිම වශයෙන් සාමාජිකයන් දස දෙනෙකු (10) පත් කිරීමට බලය ඇත්තේය. ඔවුන් සියළු දෙනාම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.

VI. මෙම දිස්ත්‍රික් සංවිධානය සඳහා එහි සාමාජිකයන් විසින් (සභාපතිවරයා) පහත සඳහන් නිළධාරී මණ්ඩලය පත් කර ගත යුත්තේය. ලේකම්, උප සභාපති, උප ලේකම්, භාණ්ඩාගාරික සහ කාරක සභිකයන් දහ දෙනෙකු (10) ඊට ඇතුලත් විය යුතුය.

VII. මෙම නිළධාරී මණ්ඩලය දිස්ත්‍රික් ක්‍රියාකාරී මණ්ඩලය යනුවෙන් නම් කෙරේ. ඒ අදළ මැතිවරණ දිස්ත්‍රික්කයේ පක්ෂයේ ප්‍රධානතම ක්‍රියාකාරී මණ්ඩලය වන්නේය.

VIII. මෙම සංවිධානයේ ලේකම් පක්ෂයේ දිස්ත්‍රික් ලේකම්වරයා වශයෙන් හැඳින්වෙනු ඇත.

6. මැතිවරණ දිස්ත්‍රික් සංවිධානය සතු කාර්යභාරය

I. මෙම සංවිධානය අදල මැතිවරණ දිස්ත්‍රික්කය තුල පක්ෂයේ සියළු කාර්යයන් මෙහෙයවීමට සහ ඉටු කිරීමට වගකීමෙන් බැඳී ඇත්තේය. පක්ෂයේ දේශපාලන විසින් පවරනු ලබන්නා වූ පක්ෂයේ සියළුම දේශපාලන අවශ්‍යතාවයන් දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක වන පක්ෂයේ අනිකුත් පහළ සංවිධාන වලට පැවරීමටත් ඒවා නිසි පරිදි අධීක්ෂණය කිරීමටත් දිස්ත්‍රික් සංවිධානය බැඳී ඇත්තේය.

II. මෙම සංවිධානයේ යෝජනා සම්මතයකින් පසුව පක්ෂයේ කාර්යයන් සඳහා දිස්ත්‍රික් අරමුදලක් ගොඩ නැගීමට මෙම සංවිධානයට බලය ඇත. නමුත්, ඒ සඳහා පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුය. මෙසේ ගොඩනගන්නා වූ අරමුදල් දිස්ත්‍රික් ක්‍රියාකාරී මණ්ඩලයේ සභාපතිවරයා සහ භාණ්ඩාගාරිකවරයාට ගනු දෙනු කල හැකි වන අයුරින් බැංකු ගිණුම් පවත්වාගෙන යා යුතුය.

III. එම අරමුදල් පක්ෂයේ යම් කාර්යයන් සඳහා වැය කිරීමේදී දිස්ත්‍රික් ක්‍රියාකාරී සංවිධානයේ අනුමැතිය සහිතව එය කල යුතුය. එසේ වැය කරනු ලබන මුදල එක් මාසයක් සඳහා රු. පන්දහසකට වැඩි වන අවස්ථාවකදී ඒ සඳහා පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුය.

## <u>තුන්වන පරිච්ඡේදය</u>

1) මධ්‍යම කාරක සභාව

I. මධ්‍යම කාරක සභාව සාමාජිකයන් 15 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

II. මෙම 15 දෙනා අතුරින් 8 දෙනෙකු පත් කිරීමේ බලය පක්ෂ නායක (සභාපති) සතුවේ.

III. තරුණ සංවිධානයේ සභාපති/ලේකම් තනතුරු දරන්නන් මධ්‍යම කාරක සභාවේ සාමාජිකයන් වශයෙන් නියෝජනය කල හැක.

2) මධ්‍යම කාරක සභාව රැස්කිරීම සහ මූලාසනය

I. මධ්‍යම කාරක සභාව අවම වශයෙන් මාස තුනකට (03) වරක් හෝ රැස්විය යුතුය.

II. මධ්‍යම කාරක සභාව රැස් කල යුත්තේ පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා විසිනි.

III. මධ්‍යම කාරක සභා රැස්වීමේදී මූලසුන පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා විසින් දැරිය යුතුය. නමුත්, ඔහුට කිසිඳු අවස්ථාවක මධ්‍යම කාරක සභා ඡන්ද විමසීමකදී ඡන්දය ප්‍රකාශ කල නොහැකි අතර, ඔහු පක්ෂයේ මධ්‍යම කාරක සභාව සහ පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ සම්බන්ධීකරණය ඇති කරන්නා වශයෙන් ක්‍රියාකරනු ඇත.

IV. පක්ෂයේ සභාපතිවරයාට අවශ්‍ය යැයි හැඟෙන ඕනෑම අවස්ථාවක මධ්‍යම කාරක සභාව රැස්කිරීමට ප්‍රධාන ලේකම්වරයාට උපදෙස් දිය හැක.

3) **මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අහෝසි වන ආකාරය**

I. පක්ෂයේ ප්‍රතිපත්ති, විනය උල්ලංඝනය කරනු ලැබ ඇති විටෙක හෝ පක්ෂයේ උන්නතියට, පක්ෂයේ පොදු සමගියට, පක්ෂයේ කීර්තියට බාධාවන අයුරින් ක්‍රියාත්මක වන අවස්ථාවකදී ඒ සඳහා පක්ෂයේ උත්තරීතර විනිශ්චය සභාවට ලැබෙන ලිඛිත පැමිණිල්ලක් පිළිබඳව එම සභාව විසින් පවත්වනු ලැබූ විධිමත් පරීක්ෂණයක නිර්දේශයක් මත පක්ෂයේ සභාපතිවරයාට මධ්‍යම කාරක සභිකයෙකු එම ධූරයෙන් නෙරපා දැමිය හැක.

II. යම් වරදක් සම්බන්ධයෙන් අධිකරණයකදී වරදකරුවෙකු බවට පත්වන යම් මධ්‍යම කාරක සභිකයෙකු වහාම පක්ෂයේ සියළු තනතුරුවලින් ඉල්ලා අස්විය යුතුය.

III. යම් වරදක් සම්බන්ධයෙන් අධිකරණයකදී චෝදනා ලබන්නා වූ යම් මධ්‍යම කාරක සභිකයෙකු ඔහු එම චෝදනා වලින් නිදහස් පුද්ගලයෙකු ලෙස අධිකරණය ප්‍රකාශයට පත් කරන තෙක් තමා පක්ෂය තුල දරණ සියළු තනතුරුවලින් ඉල්ලා අස්විය යුතුය.

IV. වයස අවුරුදු විසි දෙකට (22) අඩු වුවත්, වයස අවුරුදු හැත්තෑවට (70) වැඩිවුවත් කිසිවකුට මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකු විය නොහැක.

4) **මධ්‍යම කාරක සභාවේ බලතල හා වගකීම**

I. අපේ ජන බල පක්ෂයේ අභ්‍යන්තර සංවිධාන සතු බලතල අනුව මධ්‍යම කාරක සභාව දෙවැනි වනුයේ පක්ෂයේ දේශපාලන මණ්ඩලය සතු බලතල ඉදිරියේදී පමණි.

II. පක්ෂයේ ව්‍යවස්ථාව, ස්ථාවර නියෝග, නීතිරීති හා සාමාජිකයන්ගේ විනය පද්ධතිය ආදිය ක්‍රියාකාරීව රැක ගැනීම. ඒ අනුව අවශ්‍ය විධි නිලතල වලින් නිළධාරීන් නෙරපීම, තහනම් කිරීම , සංවිධානය පක්ෂයෙන් නෙරපීම, අනුබද්ධිත තත්ත්වයන් අහෝසි කිරීම ආදී ක්‍රියා මාර්ග ගැනීමට අවසාන තීරණය දේශපාලන මණ්ඩලය සතු වන අතර, ඒ

සෑම අවස්ථාවකදීම මධ්‍යම කාරක සභාවේ අදහස් විමසිය යුතු අතර, ඒ සෑම අවස්ථාවකම මධ්‍යම කාරක සභාවේ උපදෙස් මත ක්‍රියාකල යුතුය.

III. අවශ්‍යතා අනුව විනය මණ්ඩලය, නාම යෝජනා මණ්ඩලය ඇතුළු විවිධ මණ්ඩල හා කමිටු පත් කිරීමට දේශපාලන මණ්ඩලය වෙත නිර්දේශ කිරීමේ බලය මධ්‍යම කාරක සභාව සතු වේ.

IV. පක්ෂයේ දිස්ත්‍රික්ක බල මණ්ඩල වලට පහළ කවරම සංවිධානයක හෝ ඒවායේ සමාජිකයෙකුගේ හෝ නිළධාරියෙකුගේ හෝ නියෝජිතයෙකුගේ හෝ ක්‍රියාකලාපය පක්ෂයේ ප්‍රතිපත්ති ක්‍රියා මාර්ග තීරණවලට පටහැනි යයිද නැතහොත් පක්ෂයට හානිකර යැයිද ඒත්තු ගියවිට එම සංවිධානයේ හෝ සාමාජිකයාගේ හෝ නියෝජිතයාගේ වැඩ තාවකාලිකව නතර කර දේශපාලන මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීමේ බලය මධ්‍යම කාරක සභාව සතු වේ.

V. එසේ යම් සාමාජිකයෙකුගේ හෝ සංවිධානයක වැඩ කටයුතු තාවකාලිකව තහනම් කරනු ලැබූ අවස්ථාවක එම කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය විධිවිධාන යෙදීමේ බලය මධ්‍යම කාරක සභාව සතු වේ.

VI. විවිධ අංශයන් පිළිබඳව විශේෂ දැනුමක් සහිත පුද්ගලයන් ඇතුලත් වන්නේ උපදේශක සභාවක් පත් කිරීම මධ්‍යම කාරක සභාව සතු වගකීමක් වන අතර, එහි කාර්ය භාර්ය දේශපාලන මණ්ඩලය විසින් තීරණය කරනු ඇත.

VII. මෙසේ ගොඩ නගනු ලබන අරමුදල සම්බන්ධව සම්පූර්ණ අයවැය වාර්ථාවක් වාර්ෂිකව දිස්ත්‍රික් සංවිධානයේ මහ සභා රැස්වීමකදී සම්මත කොට එහි පිටපතක් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා වෙත යොමු කල යුතුය.

VIII. දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක වන අනිකුත් මැතිවරණ කොට්ඨාශ සංවිධාන සතු අරමුදල් පක්ෂයේ පොදු අවශ්‍යතාවයකදී දිස්ත්‍රික් සංවිධානය වෙත ලබා ගැනීමට හැකියාව ඇත. ඒ සඳහා පළමුව දිස්ත්‍රික් සංවිධානයේ යෝජනාවක් සම්මත විය යුතු අතර, ඉන්පසු එම සම්මත වූ යෝජනාව පක්ෂයේ දේශපාලන මණ්ඩලය වෙත යොමු කල යුතුය. ඒ සඳහා එහි අනුමැතිය ලද හොත් දිස්ත්‍රික් ලේකම්වරයා විසින් දේශපාලන මණ්ඩලයේ එම අනුමැතිය ලිඛිතව සෑම මැතිවරණ කොට්ඨාශ සංවිධානයක් වෙතම යොමු කල යුත්තේය. එම තීරණය අනුව ක්‍රියාතාමක වීමට මැතිවරණ කොට්ඨාශ සංවිධානයක් බැඳී සිටින අතර, එම තීරණය ගනු ලැබූ හේතුව මැතිවරණ කොට්ඨාශ සංවිධානයන්ට පැහැදිලි කිරීමට දිස්ත්‍රික් ක්‍රියාකාරී මණ්ඩල බැඳී සිටී.

IX. පළාත් පාලන ආයතන සඳහා පැවැත්වෙන මැතිවරණ වලදී මැතිවරණ වලදී සහ පළාත් සභා සඳහා පැවැත්වෙන මැතිවරණ වලදී පක්ෂයේ අපේක්ෂකයින් තෝරා ගැනීම සඳහා දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාශ සංවිධාන මගින් සහ දිස්ත්‍රික්කය තුල පක්ෂයේ ශාඛා සමිති වෙතින් නාම යෝජනා කැඳවීමට දිස්ත්‍රික් ක්‍රියාකාරී මණ්ඩලයට බලය ඇත.

එම නාම යෝජනා පරීක්ෂාකර බලා ඊට නම් සංවිධානයේ නිර්දේශයන් ඇතුලත් කර පක්ෂයේ මධ්‍යම නාම යෝජනා මණ්ඩලය වෙතට යොමු කිරීමට දිස්ත්‍රික්කයේ ක්‍රියාකාරී මණ්ඩලයට බලය ඇත. එම මැතිවරණ සඳහා ඉදිරිපත් කරන අපේක්ෂකයින් තීරණය කිරීමේදී දිස්ත්‍රික් ක්‍රියාකාරී මණ්ඩලයේ නිර්දේශයන්ට මුල් තැනක් ලැබෙන පරිදි පක්ෂයේ ඉහළ මණ්ඩල ක්‍රියාත්මක විය යුත්තේය.

## හතරවන පරිච්ඡේදය

❖ අපේ ජන බල පක්ෂයේ දේශපාලන මණ්ඩලය

1) දේශපාලන මණ්ඩලයේ සංයුතිය

I. දේශපාලන මණ්ඩලය සාමාජිකයන් 15 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

II. පක්ෂයේ මහ සම්මේලනයකදී එහි මධ්‍යම කමිටු සාමාජිකයින් අටදෙනෙකු (8) විසින් තෝරා ගනු ලබන පක්ෂයේ සාපතිවරයා නිල බලයෙන් පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ සභාපතිවරයාද වන අතර, ඔහු හෝ ඇය පක්ෂ නායකයාද වේ.

III. මීට අමතරව පක්ෂයේ මහා සම්මේලනයකදී තෝරා ගනු ලබන පක්ෂයේ ප්‍රධාන ලේකම්, භාණ්ඩාගාරික, උප සභාපති සහ උප ලේකම් දේශපාලන මණ්ඩලයේ අනිකුත් සාමාජිකයන් වේ.

IV. එහිදී පක්‍ෂයේ ලේකම් ඇතුළු අටදෙනෙකු පත් කිරීමේ අයිතිය/බලය සභාපති සතුවේ.

2) දේශපාලන මණ්ඩලයේ බලතල හ කාර්යභාර්ය

I. මෙය අපේ ජන බල පක්ෂය තීරණාත්මකවූත්, බලවත්වූත් පක්ෂයයි. පක්ෂයේ අනිකුත් සංවිධාන සියල්ලම දේශපාලන මණ්ඩල බලතල වලට යටත් වේ.

II. පක්ෂයේ ඕනෑම අංශයක් පිළිබඳව, පක්ෂයේ ඕනෑම ප්‍රතිපත්තියක් සම්බන්ධව, පක්ෂයේ ඕනෑම දේශපාලන තීරණයක් සම්බන්ධව, පක්ෂ ව්‍යවස්ථාවේ ඕනෑම කරුණක් සම්බන්ධව හෝ මෙම මණ්ඩලය ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

III. පක්ෂයේ වෙනත් ඕනෑම මණ්ඩලයක, පක්ෂයට අනුබද්ධ ඕනෑම සංවිධානයක, පක්ෂයේ ඕනෑම ශාඛා සමිතියක නිළධාරියෙකුගේ හෝ ක්‍රියාකලාපය පක්ෂයේ ප්‍රතිපත්තීන්ට, පක්ෂ විනයට, පක්ෂයේ පොදු සමගියට සහ පක්ෂයේ දියුණුවට බධාවන්වේ යැයි දේශපාලන මණ්ඩලයට හැඟෙන ඕනෑම මොහොතක එම ඕනෑම සංවිධානයක හෝ ඕනෑම නිළධාරියෙකුගේ උත්තරීතර විනිශ්චය සභාවට පැවරීමටත් දේශපාලන මණ්ඩලයට බලය ඇත. උත්තරීතර විනිශ්චය සභාව තම පරීක්ෂණයේ නිර්දේශය දේශපාලන මණ්ඩලය වෙත ලබා දුන් පසු උක්ත කරුණ සම්බන්ධයෙන් අවසාන තීරණයක් ගැනීමේ බලය දේශපාලන මණ්ඩලය සතු වේ.

IV. එම අන්දමින් යම් සාමාජිකයෙකුගේ, නිළධාරියෙකුගේ හෝ සංවිධානයක වැඩ කටයුතු තහනම් කරනු ලැබූ අවස්ථාවකදී පක්ෂ යන්ත්‍රයේ අඛණ්ඩ ක්‍රියාකාරීත්වය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තීරණ ගැනීමේ බලය පක්ෂයේ දේශපාලන මණ්ඩලය සතු වේ.

V. පක්ෂයේ පහළ සංවිධාන විසින් පවත්වාගෙන යනු ලබන අරමුදල් පක්ෂයේ පොදු කාර්යයන් සඳහා අවශ්‍යවේ යැයි හැඟන විටකදී ලබා ගැනීමට පක්ෂයේ දේශපාලන මණ්ඩලයට බලය ඇත. නමුත්, එවන් අවස්ථාවකදී දේශපාලන මණ්ඩලය විසින් එම තීරණය ගැනීමට හේතු වූ කරුණු පහළ සංවිධානයන්ට පැහැදිළි කිරීමට දේශපාලන මණ්ඩලය වගකීමෙන් බැඳී ඇත.

VI. පක්ෂය ඕනෑම මැතිවරණයක් වෙනුවෙන් ඉදිරිපත් වන අපේක්ෂකයින් තේරීම සඳහා දේශපාලන මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකු (03) ගෙන් සමන්විත මධ්‍යම නාම යෝජනා මණ්ඩලයක් පිහිටුවීමට පක්ෂයේ සභාපතිවරයාට බලය ඇත. එම කමිටුව මගින් අපේක්ෂකයන් සම්බන්ධ අවසන් තීරණය ගනු ලබන අතර, පක්ෂයේ සභාපතිවරයාගේ අනුමැතිය ඊට ලැබිය යුතුය.

VII. පක්ෂයේ අර්ධ සාමාජිකයෙකු හට පූර්ණ සාමාජිකත්වය පිරිනැමීමේ බලය දේශපාලන මණ්ඩලය සතු වේ.

VIII. පක්ෂයේ සාමාජිකයන් යම් පළාත් පැලන ආයතනයක මහජන නියෝජිතයා (මන්ත්‍රීවරුන්) වශයෙන් ක්‍රියාකරන විටකදී අවශ්‍ය වූ විටකදී එම පළාත් පාලන ආයතන තුල ඔවුන්ගේ දේශපාලන ක්‍රියාකාරීත්වය සහ තීරණයන් පාලනය කිරීමේ සහ හැසිරවීමේ අයිතිය පක්ෂයේ දේශපාලන මණ්ඩලය සතුය.

IX. පක්ෂයේ සාමාජිකයන් යම් පළාත් සභාවක මන්ත්‍රීවරුන් වශයෙන් ක්‍රියාකරන විටකදී අවශ්‍ය වූ විටකදී එම පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ දේශපාලන ක්‍රියාකාරීත්වය සහ තීරණයන් පාලනය කිරීමේ සහ හැසිරවීමේ අයිතිය පක්ෂයේ දේශපාලන මණ්ඩලය සතුය.

X. පක්ෂයේ සාමාජිකයන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් වශයෙන් ක්‍රියාකරන විටකදී එම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කණ්ඩායමේ දේශපාලන ක්‍රියාකාරීත්වය සහ තීරණයන් පාලනය කිරීමේ සහ හැසිරවීමේ අයිතිය පක්ෂයේ දේශපාලන මණ්ඩලය සතුය.

XI. පක්ෂයේ දේශපාලන ගමන් මාර්ගය සහ පක්ෂයේ දේශපාලන දර්ශණය සහ පක්ෂයේ දේශපාලන තීරණයන් ගැනීමේ අවසන් පූර්ණ අයිතිය දේශපාලන මණ්ඩලය සතුවන බැවින්, පළාත් පාලන ආයතන, පළාත් සභා සහ පාර්ලිමේන්තුව වැනි මහජන ආයතන තුල පක්ෂ සාමාජිකයන් නියෝජනය වන විට පක්ෂයේ එක්සත්භාවය, ඒකමතික භාවය, පක්ෂයේ දේශපාලන ගමන් මාර්ගය පළුදු නොවී රැක ගැනීම උදෙසා එම සෑම නියෝජිතයෙක්ම ඉහත හතරවන පරිච්ඡේදය 2 (VIII), 2(IX) , 2(X) වගන්ති අනුව ක්‍රියාකල යුතුය.

XII. එම වගන්තියට අනුව ක්‍රියා නොකරන දේශපාලන මණ්ඩලයේ තීරණයන්ට අවනත නොවන ඕනෑම මහජන නියෝජිතයෙකුට එරෙහිව ක්‍රියාකිරීමට පක්ෂයේ දේශපාලන මණ්ඩලයට බලය ඇත.

XIII. පක්ෂය වෙනුවෙන් අරමුදල් ගොඩනැගීම තීරණය කිරීමේ බලය දේශපාලන මණ්ඩලය සතු වේ.

XIV. මධ්‍යම කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන ඕනෑම යෝජනාවක් සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීමේ බලය දේශපාලන මණ්ඩලය සතුය.

XV. යම් මැතිවරණයකදී පක්ෂය තරඟ කිරීම හෝ නොකිරීම සම්බන්ධයෙන් තීරණය කිරීමේ බලය දේශපාලන මණ්ඩලය සතුය. (මීට අදලව විශේෂ විධි විධාන හතරවන පරිච්ඡේදයේ, IX අනු ඡේදය ක්‍රියාත්මක වේ)

XVI. අනිකුත් දේශපාලන පක්ෂ සමග සාකච්ඡා කිරීම, මැතිවරණ වලදී වෙනත් දේශපාලන පක්ෂ සමග පෙරමුණු ගොඩනැගීම, මහජන නියෝජන ආයතන (පළාත් පාලන ආයතන, පළාත් සභා, පාර්ලිමේන්තුව) තුලදී අනිකුත් දේශපාලන පක්ෂ සමග ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳව තීරණ ගැනීමේ බලය දේශපාලන මණ්ඩලය සතුය.

XVII. පක්ෂය වෙනුවෙන් නිකුත් කරනු ලබන සියළුම ප්‍රකාශණ, පුවත්පත් නිවේදන, ගුවන් විදුලි හෝ රූපවාහිනී වැඩ සටහන් සඳහා ඉදිරිපත් කිරිම ආදියේදී තීරණ ගැනීමේ බලය දේශපාලන මණ්ඩලය සතුය.

XVIII. පක්ෂයේ නම, සලකුණ, වර්ණය, ලිපිනය සහ අනෙකුත් කරුණු වෙනස් කිරීමේ බලය දේශපාලන මණ්ඩලය සතුය. එහි සාමාජිකයන් 15 දෙනාගේ අනුමැතිය ප්‍රමාණවත් වන අතර එය පක්ෂයේ සභාපති සහ ලේකම් විසින් අත්සන් සහිතව සහතික කල යුතුය. තවද පක්ෂයේ දියුණුව සඳහා ඕනෑම අවස්ථාවක දේශපාලන මණ්ඩලය රැස්වීමට බලය ඇත.

3) **දේශපාලන මණ්ඩලය රැස්වීම්/ මූලාසනය/ තීරණ වලංගුභාවයට පත්වන ආකාරය**

I. පක්ෂයේ දේශපාලන මණ්ඩලය අවම වශයෙන් මාස 04කට වරක්වත් රැස්විය යුතුය.

II. එහි මූලාසනය පක්ෂයේ නායකයා (සභාපතිවරයා) දැරිය යුතුය.

III. පක්ෂයේ නායකයාට හැඟෙන ඕනෑම අවස්ථාවක පක්ෂයේ දේශපාලන මණ්ඩල රැස්වීම කැඳවිය හැකිය.

IV. පක්ෂයේ දේශපාලන මණ්ඩලය තුල යම් කරුණක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේ ගැටළු සහගත තත්වයක් මතු වුවහොත් ඒ සඳහා ඡන්ද විමසීමක් පැවැත්විය යුතුය. එම ඡන්ද විමසීම් පැවැත්වෙන විටකදී දේශපාලන මණ්ඩලයේ සියළු සාමාජිකයන් ඊට සහභාගී විය යුතුය.

V. දේශපාලන මණ්ඩලය ගනු ලබන සෑම තීරණයක්ම ලිඛිතව සකස් කිරීමට පක්ෂයේ ප්‍රධාන ලේකම් ක්‍රියා කල යුතු අතර, එම ලේඛණයට පක්ෂයේ නායකයාගේ අත්සන යෙදූ විට එම තීරණය වලංගු තීරණයක් බවට පත්වේ.

VI. පක්ෂයේ නායකයා (දේශපාලන මණ්ඩල සභාපතිවරයා) නොමැතිව කිසිඳු තීරණයක් ගැනීමට දේශපාලන මණ්ඩලයට බලය නොමැත. (සභාපතිවරයාගේ බලතල සම්බන්ධයෙන් හැර)

VII. නමුත් යම් හදිසි තත්ත්වයක් තුලදී දේශපාලන මණ්ඩලයේ සභාපතිවරයාට තවත් දේශපාලන මණ්ඩල සභිකයන් 04 දෙනෙකු සමගින් පක්ෂයට අදල ඕනෑම තීරණයක් ගැනීමට බලය ඇත්තේය.

VIII. දේශපාලන මණ්ඩල සභිකයන් 10 දෙනා අතුරින් 06 දෙනෙකුගේ හෝ ඊට වැඩි ප්‍රමාණයක කැමැත්ත ඇතිව සභාපතිවරයාගේ බලතල වෙනස් කල හැක. නමුත් ඒ සඳහා මධ්‍යම කාරක සභාවේ 2/3 ක අනුමැතිය ලැබිය යුතුය.

4) **දේශපාලන මණ්ඩල සාමාජිකයෙකුගේ, ධූරය අහෝසි වීම, ධූර කාලය, පුරප්පාඩු පිරවීම සහ වයස් සීමාවන්**

**ධූරය අහෝසි වීම**

I. යම් දේශපාලන මණ්ඩල සාමාජිකයෙකු පක්ෂයේ ප්‍රතිපත්ති, පක්ෂ විනය උල්ලංඝනය කරනු ලැබී යැයි හැඟෙන විටක හෝ පක්ෂයේ උන්නතියට පක්ෂයේ පොදු සමගියට කීර්තියට හානි කර අයුරින් ක්‍රියාත්මක වන අවස්ථාවකදී, පක්ෂයේ මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාවන් සම්මත වීමෙන් පසු පක්ෂයේ සභාපතිවරයාට පක්ෂයේ ඕනෑම දේශපාලන මණ්ඩල සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කල හැක.

II. පක්ෂයේ සභාපතිවරයා ඇතුළු දේශපාලන මණ්ඩල සභිකයින් පස්දෙනෙකු (05) තීරණය මත ඕනෑම දේශපාලන මණ්ඩල සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කල හැක.

III. පක්ෂයේ මහ සම්මේලනයකදී හෝ පක්ෂයේ විශේෂ මහ සම්මේලනයක් කැඳවීමෙන් පසුව එහි නියෝජිතයන්ගේ බහුතර ඡන්දයෙන් දේශපාලන මණ්ඩල සාමාජිකයෙකු ඉවත් කිරීමට පක්ෂයේ සභාපතිවරයාට බලය ඇත.

IV. දේශපාලන මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් සිටියදී යම් වරදක් සම්බන්ධයෙන් අධිකරණයකදී චෝදනා ලබන්නකු එම චෝදනාවෙන් නිදහස් වනතුරු තාවකාලික ධූරයෙන් ඉවත් කිරීමට පක්ෂයේ සභාපතිවරයා ක්‍රියාකල යුතුය.

**දේශපාලන මණ්ඩල සභිකයකුගේ ධූරකාලය**

I. දේශපාලන මණ්ඩල සාමාජිකයෙකුගේ (සභාපතිවරයා හැර) ධූර කාලය වසර හතකි. (07)

II. එම කාලය අවසන් වීමට මාස හයකට (06) පෙර කාල සීමාව තුලද හෝ ඉන් පසුව පැවැත්වෙන පක්ෂයේ මහා සම්මේලනයේදී වසර හයක (06) ධූර කාලයක් සම්පූර්ණ කර ඇති දේශපාලන මණ්ඩල සාමාජිකයන්ගේ නම් නැවත යෝජනා කොට සම්මත කිරීමේ තවත් වසර හතක (07) කාලයක් සඳහා නැවත දේශපාලන මණ්ඩලයට පත් කිරීමට හැකියාව ඇත.

එම යෝජනාව පක්ෂයේ මහා සම්මේලනය විසින් සම්මත කරනු නොලැබුවහොත් පක්ෂයේ සභාපතිවරයා විසින් නියමිත ක්‍රියා පටිපාටිය අනුව නව දේශපාලන මණ්ඩල සාමාජිකයෙකු තෝරා ගැනීමට ක්‍රියා කල යුතුය.

III. යම් දේශපාලන මණ්ඩල සභිකයෙකුට (සභාපතිවරයාට හැර) අඛණ්ඩව එම ධූරය දැරිය හැකි වාර ගණන පහකි. (05).

5) දේශපාලන මණ්ඩලය තුල පුරප්පාඩු පිරවීම

I. යම් හේතුවකින් දේශපාලන මණ්ඩලයේ පුරප්පාඩුවක් ඇති වූ වහාම පක්ෂයේ සභාපති විසින් දින තුනක (03) කාලයක් තුලදී මධ්‍යම කාරක සභිකයකු තාවකාලිකව දේශපාලන මණ්ඩලයට පත්කල යුතුය.

II. ඉන් පසු, මාසයක කාල සීමාවක් ඇතුලතදී එම පුරප්පාඩු ධූරය කලින් නියෝජනය කලා වූ දේශපාලන මණ්ඩල සාමාජිකයා දේශපාලන මණ්ඩලය දක්වා පැමිණි පක්ෂයේ ක්ෂේත්‍රයට අදාලව මධ්‍යම කාරක සභාව විසින් දේශපාලන මණ්ඩල සාමාජිකයා තෝරාපත් කල යුතුය.

III. පුරප්පාඩු වූ ධූරය කලින් හොබවනු ලද පක්ෂයේ මධ්‍යම කාරක සභාව පක්ෂයේ සභාපතිවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයන් දහ දෙනා (10) නියෝජනය කල අය නම් ඒ වෙනුවට ඒ අතුරින් වෙනත් අයෙකු සිය අභිමතය පරිදි පක්ෂයේ සභාපතිවරයා විසින් තෝරා ගත යුතුය.

IV. පුරප්පාඩු වූ ධූරය කලින් හොබවන ලද්දේ පක්ෂයේ ප්‍රධාන ලේකම් හෝ භාණ්ඩාගාරික තනතුරු දැරූ සාමාජිකයන් විසින් නම් පක්ෂයේ මහා සම්මේලනයකදී එම තනතුරු සඳහා නව නිළධාරීන් දෙදෙනෙකු තෝරා පත් කර ගත යුතුය.

V. එතෙක් තනතුරු සඳහා පක්ෂයේ සභාපතිවරයා විසින් වෙනත් දේශපාලන මණ්ඩල සභිකයෙකු පත් කල යුතු අතර, පුරප්පාඩු වූ දේශපාලන මණ්ඩල ධූරය සඳහා තාවකාලික මධ්‍යම කාරක සභිකයෙකු පත් කිරීමට පක්ෂයේ සභාපතිවරයා ක්‍රියාකල යුතුය.

VI. දේශපාලන මණ්ඩල සභිකයෙකුගේ අවම වයස් සීමාව අවුරුදු තිහක් (30) විය යුතුය.

# පස්වන පරිච්ඡේදය

❖ අපේ ජන බල පක්ෂයේ නායකත්වය සහ ප්‍රධාන නිළධාරීන්

1) පක්ෂයේ නායකයා (සභාපතිවරයා)

I. මෙම ව්‍යවස්ථාවේ සියළුම පරිච්ඡේදයන්හි පක්ෂයේ සභාපතිවරයාට ක්‍රියාත්මක කල හැකි බලතල සඳහන්ව ඇත. මෙම ව්‍යවස්ථාවේ සඳහන්ව නොමැති කරුණු සඳහා තීරණ ගැනීමේ අයිතිය පක්ෂයේ සභාපතිවරයාට (පක්ෂයේ නායක) පැවරේ. නමුත්, ඒ සඳහා දේශපාලන මණ්ඩලයේ අනුමැතිය ලැබිය යුතුය.

II. පක්ෂයේ නායකයා මිය ගිය විටක හෝ සිය ධූරයෙන් ඉල්ලා අස්වූ විටක හෝ පක්ෂයේ ප්‍රධාන ලේකම් විසින් පක්ෂයේ දේශපාලන මණ්ඩලය දින හතක් ඇතුලත රැස් කර තාවකාලික දේශපාලන මණ්ඩල සභාපතිවරයෙකු පත් කර ගත යුතු අතර, ඔහු පක්ෂයේ වැඩ බලන නායකයා වශයෙන් ක්‍රියා කරනු ඇත.

III. ඉන්පසු, මාස හයක (06) කාලයක් ඇතුලතදී පක්ෂයේ මහා සම්මේලනයක් කැඳවීමට පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා ක්‍රියාකල යුතු අතර, එහිදී පක්ෂයට නව නායකයෙකු තෝරා ගැනීම කල යුතුය. ඔහු පක්ෂයේ නව නායකයා වන අතර, පක්ෂයේ පෙර පක්ෂ නායකයා ලැබූ "යාවජීව නායකත්ව" වරප්‍රසාදය ඔහුට ද හිමි වනු ඇත.

IV. එම තනතුර සඳහා ඔහුට හෝ ඇයට නැවත තේරී පත්විය හැක්කේ පක්ෂ මහා සම්මේලනයකදී ගෙනෙන යෝජනාවක් සම්මත වුවහොත් පමණි.

2) පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා

I. මෙම තනතුර දරන්නා පක්ෂයේ මහා සම්මේලනයේ නියෝජිතයින් විසින් හෝ පක්ෂ නායකයා විසින් තෝරා ගනු ඇත.

II. පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා, පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා වශයෙන් ක්‍රියාකරනු ඇත.

III. පක්ෂයේ ප්‍රධාන ලේකම් ධූරයේ නිළ කාල සීමාව වසර අටකි. (08)

IV. පක්ෂයේ සාමාජිකයෙකුට පක්ෂයේ ප්‍රධාන ලේකම්ධූරය අඛණ්ඩව දැරිය හැකි උපරිම වාර ගණන තුනකි. (03)

V. පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා ඉල්ලා අස්වූ විටක, අසු කරනු ලැබූ විටක හෝ මිය ගිය විටක පක්ෂයේ නායකයා විසින් තාවකාලික ප්‍රධාන ලේකම්වරයෙකු දින දෙකක් (02) ඇතුලත පත් කර ඉන්පසු, පැවැත්වෙන පක්ෂ වාර්ෂික සම්මේලනයේදී සම්මත කරගත යුතුය. නැතහොත්, වෙනත් ප්‍රධාන ලේකම්වරයෙකු පක්ෂ සම්මේලනය විසින් තෝරා ගත යුතුය.

VI. පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා පක්ෂයේ මධයම කාරක සභාව කැඳවීම සහ එහි මූලාසනයේ කටයුතු කරනු ඇත.

VII. සෑම පක්ෂ මහා සම්මේලනයකදීම පක්ෂයේ එතෙක් ක්‍රියාකාරීත්වය සම්බන්ධ පරිපූර්ණ වාර්ථාවක් ප්‍රධාන ලේකම්වරයා විසින් සම්මේලනයට ඉදිරිපත් කල යුතුය.

VIII. පක්ෂයේ මධ්‍යම කාරක සභාව සහ පක්ෂයේ දේශපාලන මණ්ඩලය අතර, මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාමේ වගකීම පක්ෂයේ ප්‍රධාන ලේකම් සතුය.

IX. පක්ෂයේ ප්‍රධාන ලේකම් ධූරය දැරිය හැක්කේ වයස අවුරුදු තිහත්, හැටපහත් (30-65) අතර අයකුට පමණි.

X. පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා විසින් පක්ෂයේ දේශපාලන මණ්ඩල තීරණයන් සභාපතිවරයාගේ අත්සන් සහිතව ලිඛිතව පක්ෂයේ පහළ මණ්ඩලයට යොමු කෙරිය යුතුය.

XI. පක්ෂයේ පහළ මණ්ඩලයන්හි ක්‍රියාකාරීත්වය පිළිබඳව ලිඛිත වාර්තා පවත්වාගෙන යාම පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා සතු වේ.

XII. පක්ෂයේ ලේකම්වරයා පක්ෂයේ දියුණුවට වැඩකටයුතු නොකරන බවට හැඟෙන්නේනම් ඔහු ඉවත්කර වෙනත් අයෙකු පත්කිරීමේ බලය පක්ෂයේ සභාපතිවරයා සතුවේ.

3) **පක්ෂයේ භාණ්ඩාගාරිකවරයා**

I. මෙම තනතුර දරණ පක්ෂ සාමාජිකයා පක්ෂ මහා සම්මේලනයේදී තෝරා ගනු ලබන අතර, ඔහු පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ මුදල් ලේකම් තනතුර දරනු ඇත.

II. මොහු පක්ෂයේ සෑම අරමුදලක් සම්බන්ධයෙන්ම ගිණුම් වාර්තා පවත්වාගෙන යා යුතු අතර, පක්ෂයේ අරමුදල් සම්බන්ධ පූර්ණ වාර්ථාවක් පක්ෂ මහා සම්මේලනයට ඉදිරිපත් කල යුතුය.

III. පක්ෂයේ සෑම පහළ සංවිධානයකම, සෑම අනුබද්ධිත අරමුදල් සම්බන්ධයෙන් වූ වාර්තාවක් සෑම මාස හයකට (06) වරක්ම පක්ෂයේ දේශපාලන මණ්ඩලයට ඉදිරිපත් කල යුතුය.

IV. පක්ෂයේ අරමුදල් ශක්තිමත් කිරීම උදෙසා වූ ක්‍රියාමාර්ග සොයා බලා පක්ෂයේ දේශපාලන මණ්ඩලයට ඉදිරිපත් කිරීම පක්ෂයේ භාණ්ඩාගාරික සතු වගකීමකි.

4) **පක්ෂයේ විනය මණ්ඩලය සහ එහි සභාපතිවරයා**

I. මෙය පක්ෂයේ විනය මණ්ඩලය වශයෙන් ක්‍රියාකරනු ඇත.

II. මෙහි සභාපතිවරයා පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ සාමාජිකයෙකු විය යුතු අතර, ඔහු පක්ෂයේ සභාපතිවරයා විසින් නම් කරනු ඇත.

III. පක්ෂයේ ඕනෑම සාමාජිකයෙකු, සංවිධානයක් හෝ නිළධාරියෙකු සම්බන්ධයෙන් පක්ෂයේ සාමාජිකයෙකු හෝ සංවිධානයක් විසින් හෝ කරනු ලබන ලිඛිත පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා පක්ෂයේ සභාපතිවරයා වෙත ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමට මෙම කමිටුව ක්‍රියා කල යුතුය. පක්ෂයේ සභාපතිවරයා විසින් එම පක්ෂ සාමාජිකයා නිළධාරියා හෝ පක්ෂයේ සංවිධානයක් සම්බන්ධයෙන් සිය තීරණය ගත යුත්තේ එම නිර්දේශය පදනම් කර ගනිමිනි.

IV. මෙහි සභාපතිවරයා ඇතුළු සාමාජිකයන් පස් (05) දෙනෙකු සිටිය යුතුය.

V. පක්ෂයේ මධ්‍යම කාරක සභාව දහ (10) දෙනෙකු ඉතිරි සාමාජිකයන් වශයෙන් සභාපතිවරයා විසින් පත් කරනු ඇත.

# හයවන පරිච්ඡේදය

❖ අනුබද්ධ සංවිධාන සහ මැතිවරණ කොට්ඨාශ සංවිධායකවරයා

1) අනුබද්ධ සංවිධාන

I. අපේ ජන බල පක්ෂයේ නාමයෙන් හැඳිනවෙන තරුණ/කාන්තා/ශිෂ්‍ය සංවිධානයනුත් දේශපාලන මණ්ඩලය විසින් තීරණය කරනු ලබන තවත් ක්ෂේත්‍රයන් සඳහාත් අදාලව පිහිටවනු ලබන සංවිධාන මෙයින් අදහස් කෙරේ.

2) මැතිවරණ කොට්ඨාශ සංවිධායක

I. මැතිවරණ කොට්ඨාශයක් තුල ස්ථිර පදිංචිය දරන්නා වූ පක්ෂයේ සාමාජිකයෙකු වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු සිටීනම් ඔහු නිල බලයෙන් එම මැතිවරණ කොට්ඨාශයේ සංවිධායකවරයා වශයෙන් ක්‍රියාකරනු ඇත.

II. එම මැතිවරණ කොට්ඨාශය තුල ස්ථිර පදිංචිය දරන්නා වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු නොමැති තත්ත්වයකදී එහි ස්ථිර පදංචිය දරණ පක්ෂයේ සාමාජිකයෙකු වන පළාත් සභා මන්ත්‍රීවරයා සිටීනම් ඔහු සිය නිළ බලයෙන් එම මැතිවරණ කොට්ඨාශයේ සංවිධායකවරයා වේ.

III. ඉහත සඳහන් තොරතුරු දරණ පක්ෂයේ සාමාජිකයෙකු යම් මැතිවරණ කොට්ඨාශයක් තුල නොමැති විටකදී පක්ෂයේ සභාපති (නායකයා) විසින් මැතිවරණ කොට්ඨාශ සංවිධායකවරයෙකු පත් කරනු ඇත.

IV. මැතිවරණ කොට්ඨාශ සංවිධායකවරයා සිය නිල බලයෙන් පක්ෂයේ මැතිවරණ කොට්ඨාශ සංවිධානයේ සභාපතිවරයාද වන්නේය.

V. යම් මැතිවරණ කොට්ඨාශයක් තුල පකෂයේ සාමාජිකයකු වන වයස අවුරුදු 35ට අඩු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා ඇමතිවරයෙකු වී සිටී නම් ඔහු මැතිවරණ කොට්ඨාශ සංවිධානයේ සභාපති ධූරයට අමතරව මැතිවරණ කොට්ඨාශ තරුණ සංවිධානයේ සභාපතිධූරයට සිය නිල බලයෙන් තේරී පත් වේ. මෙවන් අවස්ථාවකදී පක්ෂයේ සභාපතිවරයාට ඒ පිළිබඳව සිය අභිමතය පරිදි තීරණයක් ගැනීමට බලය තිබේ.

VI. යම් මැතිවරණ කොට්ඨාශයක් තුල පක්ෂයේ සාමාජිකයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් එක් අයෙකුට වැඩි සංඛ්‍යාවක් ස්ථිර පදිංචිය දරණ අවස්ථාවකදී පක්ෂයේ සභාපතිවරයා (නායකයා) විසින් සංවිධායකවරයා නම් කරනු ඇත.

VII. යම් මැතිවරණ කොට්ඨාශයක් තුළ ස්ථිර පදිංචිය පක්ෂයේ සාමාජිකයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු නොමැති තත්ත්වයක් තුල එම කොට්ඨාශයේ ස්ථිර පදිංචිය දරණ පළාත් සභා ඇමතිවරුන් එක් අයෙකුට වැඩි ප්‍රමාණයක් සිටී නම් ඔවුන් අතුරින් අක් අයෙකු කොට්ඨාශයේ සංවිධායකවරයා වශයෙන් පක්ෂයේ සභාපති (නායකයා) විසින් පත් කරනු ඇත.

VIII. මැතිවරණ කොට්ඨාශය තුල පක්ෂයේ සියළු කටයුතු පවත්වාගෙන යාම, වර්ධනය කිරීම සහ ප්‍රචාරක කටයුතු මෙහෙයවීම සංවිධායකවරයා සතු වගකීම වේ.

IX. තමා වගකීම දරණ මැතිවරණ කොට්ඨාශයේ පක්ෂ ක්‍රියාකාරීත්වය සම්බන්ධ සවිස්තර වාර්ථාවක් සෑම මාස තුනකට (03) වරක්ම මැතිවරණ කොට්ඨාශයේ සංවිධායකවරයා පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයාට ලබා දිය යුතුය.

X. මැතිවරණ කොට්ඨාශය තුල ක්‍රියාත්මක වන පක්ෂයේ අනිකුත් සංවිධානයන් (තරුණ/කාන්තා/ශිෂ්‍ය) සහ පක්ෂයට අනුබද්ධ අනිකුත් සංවිධානයන්හි ක්‍රියාකාරීත්වයන් සොයා බැලීමට හා ඒවා පක්ෂයේ සමස්ත ක්‍රියාවලිය සමග ඒකාබද්ධව පවත්වාගෙන යාම සංවිධායකවරයා සතු වගකීමකි.

XI. යම් මැතිවරණයකදී මැතිවරණ කොට්ඨාශ සංවිධායකවරයා මැතිවරණය සඳහා අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත් වීමට අවකාශ නොලැබුවහොත් පක්ෂය විසින් නම් කරනු ලබන මැතිවරණ අපේක්ෂකයාට සම්පූර්ණ සහය ලබා දීමට සංවිධායකවරයා බැඳී සිටී.

XII. මැතිවරණ කොට්ඨාශ සංවිධායකවරයෙකු පක්ෂයේ ප්‍රතිපත්ති, විනය උල්ලංඝනය කරනු ලැබූ විටකදී ඔහුගේ ක්‍රියාකාරීත්වය පක්ෂයේ පොදු සමගියට, පක්ෂයේ දේශපාලන මතවාදී එක්සත් භාවයට සහ පක්ෂයේ කීර්තියට හානි කර යැයි ඒත්තු යන විටකදී පක්ෂයේ සභාපතිවරයාට (නායකයාට) සංවිධායකවරයා ඉවත් කෙරිය හැක.

(7)

## හත්වන පරිච්ඡේදය

❖ අපේ ජන බල පක්ෂයේ මහා සම්මේලනය

1) පක්ෂයේ මහා සම්මේලනය - කැඳවීම/ මූලාසනය/ කාලය

I. මෙම පක්ෂ මහා සම්මේලනය වර්ෂයකට වරක් අනිවාර්යයෙන්ම කැඳවිය යුතුය.

II. පක්ෂ සම්මේලනය පවත්වනු ලබන දිනය පක්ෂයේ දේශපාලන මණ්ඩලය විසින් තීරණය කල යුතුය.

III. පක්ෂයේ දේශපාලන මණ්ඩලයට විශේෂ පක්ෂ මහා සම්මේලනයක් කැඳවීමට බලය ඇත.

IV. පක්ෂ මහා සම්මේලනයේ මූලාසනය සභාපතිවරයා විසින් දැරිය යුතුය.

V. පක්ෂයේ සභාපතිධූරය හිස්වූ අවස්ථාවක කැඳවනු ලබන පක්ෂ මහා සම්මේලනයකදී පක්ෂ නව සභාපතිවරයෙකු තෝරා පත්කර ගන්නා තෙක් සම්මේලනයේ වැඩ කටයුතු පක්ෂයේ ප්‍රධාන ලේකම් විසින් මෙහෙයවිය යුතුය.

VI. පක්ෂයේ මහා සම්මේලනය කැඳවනු ලබන්නේ පක්ෂයේ දේශපාලන මණ්ඩලය විසින් ගනු ලබන තීරණයට අනුව පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා විසිනි.

VII. යම් මැතිවරණ කොට්ඨාශයක හෝ යම් මැතිවරණ දිස්ත්‍රික්කයක් තුල හෝ දෙවන පක්ෂ මහා සම්මේලනය කැඳවන අවස්ථාව වන විට අවශ්‍ය සංවිධාන ගොඩ නැංවීමට හැකියාව නොලද හොත් පක්ෂයේ මධ්‍යම කාරක සභාව සහ පක්ෂයේ දේශපාලන මණ්ඩලයට අවශ්‍ය සාමාජිකයන් සහ ඒ ඒ දිස්ත්‍රික්කයන් සඳහා දිස්ත්‍රික් සංවිධායකවරුන් පත්කිරීමට පක්ෂයේ සභාපතිවරයාට බලය පැවරේ. නියමිත සංවිධාන ජාලය ගොඩ නැගූ පසුව පැවැත්වෙන පක්ෂ මහා සම්මේලනයේදී එම සියළුම පත්කිරීම් සම්මත වීම හෝ වෙනත් අය ඒ සඳහා පත් කිරීම සිදු කළ යුතුය.

2) පක්ෂයේ මහා සම්මේලනය සඳහා සහභාගී වන නියෝජිතයින්

I. පක්ෂයේ දේශපාලන මණ්ඩල සාමාජිකයන්

II. පක්ෂයේ සියළුම මධ්‍යම කාරක සභිකයන්

III. මැතිවරණ දිස්ත්‍රික් සංවිධානයන්හි ලේකම්/ සභාපති/ භාණ්ඩාගාරික නිළ දරන්නන් ඇතුළු පස් දෙනෙකු (05) බැගින්

IV. දිස්ත්‍රික් තරුණ සංවිධානයන්හි සභාපති/ ලේකම්

V. දිස්ත්‍රික් කාන්තා සංවිධානයන්හි සභාපති/ ලේකම්/ භාණ්ඩාගාරික තනතුරු දරන්නන්

VI. පක්ෂයේ සෑම අනුබද්ධ සංවිධානයකම සභාපති/ ලේකම්/ භාණ්ඩාගාරික නිළ දරන්නන් ඇතුළු පස් දෙනෙකු (05) බැගින්

VII. තරුණ සංවිධානයේ මධ්‍ය කමිටුවේ නිළධාරීන් සහ කාන්තා සංවිධානයේ මධ්‍ය කමිටුවේ නිළධාරිනියන්

VIII. සියළුම මැතිවරණ කොට්ඨාශ සංවිධායකවරුන් සහ දිස්ත්‍රික් සංවිධායකවරුන්

IX. සියළුම මැතිවරණ කොට්ඨාශ සංවිධානයන්හි (සභාපතිට අමතරව) ලේකම් ඇතුළු තිදෙනෙකු (03)

X. පක්ෂයේ සාමාජිකයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්/ පළාත් සභා මන්ත්‍රීවරුන්/ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්

3) **පක්ෂ මහා සම්මේලනයක කාර්යභාර්ය**

I. මෙය පක්ෂයේ සියළුම අංශයන්හි නියෝජිතයින් ඒකරාශී වන්නා වූ එකම සම්මේලනය වන බැවින් පක්ෂයේ වර්ධනය, ගමන් මාර්ගය, පක්ෂයේ සංවිධාන සහ සාමාජිකයන් සම්බන්ධයෙන් පුළුල් ලෙසින් සාකච්ඡාවට භාජනය කරන්නා වූත්, පක්ෂයේ සියළු අංශයන් තුල මතවාදී එක්සත් භාවය ඇති කිරීම සඳහා ප්‍රධානතම වේදිකාව වශයෙනුත් ක්‍රියාත්මක විය යුත්තේය.

II. පක්ෂයේ නායකයා (සභාපති), පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා සහ පක්ෂයේ භාණ්ඩාගාරිකවරයා අවශ්‍ය අවස්ථාවන්හිදී පත් කර ගැනීමට මෙම සම්මේලනයෙන් නියෝජිතයන් ක්‍රියාකල යුතුය.

III. මීට අමතරව පක්ෂයේ වර්ධනය සඳහා අවශ්‍ය යැයි හැඟෙන තීරණ සම්මත කර ගැනීමට මෙම සම්මේලනයේ නියෝජිතයන්ට හැකියාව ඇත.

IV. පක්ෂයේ දේශපාලන මණ්ඩලය විසින් ගනු ලැබ ඇති තීරණයන් සම්බන්ධයෙන් පක්ෂයේ මහා සම්මේලනයට කරුණු පැහැදිලි කිරීමට, විග්‍රහ කිරීමට පක්ෂයේ සභාපතිවරයා කටයුතු කල යුතුය. එම තීරණ සම්බන්ධයෙන් පක්ෂ මහා සම්මේලනයේදී විවෘතව තම අදහස් ප්‍රකාශ කිරීමට සෑම නියෝජිතයෙකුටම අයිතිය ඇත්තේය.

නියෝජිතයන් විසින් ඉදිරිපත් කරන එම අදහස සම්බන්ධයෙන් පක්ෂයේ දේශපාලන මණ්ඩලය සැලකිලිමත් වීමට බැඳී සිටී.

## අටවන පරිච්ඡේදය

❖ විශේෂ විධි විධාන

1) පක්ෂ සංවිධානයන් ක්‍රියාත්මක වන විටදී මතුවන්නා වූ යම් ගැටළුකාරී තත්ත්වයන් සම්බන්ධයෙන් මෙම ව්‍යවස්ථාව තුල අවශ්‍ය විධිවිධානයන් අඩංගුව නොමැති නම් එම තත්ත්වය සම්බන්ධයෙන් පක්ෂයේ සභාපතිවරයාට ලිඛිතව දැන්විය යුතුය.

2) එම දැන්වීම් කිරීමේ බලය අදල සංවිධානයේ ලේකම්වරයාට පැවරේ. එම ලිඛිතව දැන්වීම් ලැබී සති දෙකක (02) කාලයක් ඇතුලතදී පක්ෂයේ සභාපතිවරයා ඇතුළු පක්ෂයේ දේශපාලන මණ්ඩලය අවශ්‍ය නව විධිවිධානයන් තේරීමට කටයුතු ක්‍රියා කල යුතුය. ඒ අන්දමින් පක්ෂයේ දේශපාලන මණ්ඩලය විසින් නිගමනය කරන්නා වූ නව ව්‍යවස්ථා අංගයන් සම්බන්ධයෙන් නිවේදනයක් පක්ෂයේ මධ්‍යම කාරක සභාවට සහ පක්ෂයේ අනිකුත් සංවිධානයන්ට වහාම නිකුත් කිරීමට පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා ක්‍රියාකල යුතු අතර පක්ෂයේ මධ්‍යම කාරක සභාවට ඒ පිළිබඳව පූර්ණ පැහැදිලි කිරීමක් සිදු කිරීමට පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා බැඳී සිටී.

3) ඉන්පසුව එළඹෙන පක්ෂ මහා සම්මේලනයේදී එම පනවනු ලැබූ නව විධි විධානයන් සම්බන්ධයෙන් පක්ෂ මහා සම්මේලනයට කරුණු ඉදිරිපත් කොට එම විධිවිධානයන් සඳහා පක්ෂ සම්මේලනයේ අනුමැතිය ලබා ගැනීමට පක්ෂයේ සභාපතිවරයා ක්‍රියාකල යුතුය.

4) මෙම ව්‍යවස්ථාවේ සඳහන් යම් විධිවිධානයන් භාවිතාවේදී මෙම ව්‍යවස්ථාවේම අන්තර්ගත වන්නා වූ තවත් විධිවිධානයන් සමගින් යම් ප්‍රති විරෝධී ස්වරූපයක් පෙන්නුම් කරන්නා වූ විටකදී ඒ පිළිබඳව අවසන් විග්‍රහය ඉදිරිපත් කිරීමේ බලය පක්ෂයේ දේශපාලන මණ්ඩලය සතු වේ.

5) මෙම ව්‍යවස්ථාවේ සඳහන් යම් වගන්තියක් සම්බන්ධයෙන් අර්ථ නිරූපනයේදී යම් අපහසුතාවක් පවතීනම් එය විග්‍රහ කිරීමේ සහ තේරුම් කිරීමේ බලය පක්ෂයේ දේශපාලන මණ්ඩලය සතු වේ.

6) පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් ගරු මැතිවරණ කොමසාරිස්වරයා විසින් පිළිගනු ලබන තුරු පැවැත්වෙන ඕනෑම මැතිවරණයකදී පක්ෂයේ දියුණුවට අදල වන පරිදි තීරණ ගනු ලැබීමට පක්ෂ නායකයාට බලය ඇත.

7) මෙම ව්‍යවස්ථාව ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවන්ට පරිවර්ථනය කල යුතු අතර, එම පරිවර්ථනයන් සහ මෙම ව්‍යවස්ථාව අතරේ යම් පරස්පරතාවයක් පවතී නම් එවිට පිළිගත යුත්තේ මෙම සිංහල ව්‍යවස්ථාව විය යුතුය.